# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/9/2018 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2018.01 .11 |

ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) **01-2018**

දකුණු පළාතේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන් දීමේ නිලධාරීන් වෙත.

.

**<u>විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/2017 හා 2017.10.13 දිනැති ලිපිය හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

02. එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/6/8/3 හා 2017/12/29 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

03.රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/2017 මගින් ඉහත කරුණට අදාළව නිකුත් කරන ලද 2007.05.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2007 හි විධිවිධාන කෙරෙහි අවධානය යොමුකර ඇති අතර,කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවනු ලබන නිලධරයන් සඳහා වැටුප් ගෙවීමේදී පහත පරිදි කටයුතු කළ යුතු බවට සඳහන් කර ඇත.

04. 2016.01.01. දිනට පසුව කොන්ත්‍රාත් කාල සීමාව සම්පූර්ණ කර නැවත කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගන්නා නිලධරයන් හා 2016.01.01 දිනට පසුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2007 හි විධිවිධාන යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවනු ලබන නිලධරයන්ට එම චක්‍රලේඛය යටතේ අදාළ වන දීමනාව ගණනය කිරීමේ දි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන 11 හි සඳහන් වැටුපේ සහ ගැලපීමේ දීමනාවේ අර්ධය යොදා ගත යුතුය.

මෙම චක්‍රලේඛ උපදෙස් පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත්: 01. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) : අ.ක.ස.
02. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) : අ.ක.ස.
03. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
04. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත : දැ.ගැ.ස.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 27/2017

මගේ අංකය : EST-4/02/REM/0101 (01 වෙළුම)
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.10.13

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## විශ්‍රාමික රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2007.05.11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2007 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයෙහි විධිවිධාන පරිදි කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවනු ලබන නිලධරයන් සඳහා වැටුප් ගෙවීමේ දී පහත පරිදි කටයුතු කළ යුතු බව දන්වා සිටිමි.

I. 2016.01.01 දිනට පසුව කොන්ත්‍රාත් කාල සීමාව සම්පූර්ණ කර නැවත කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගන්නා නිලධරයන් හා 2016.01.01 දිනට පසුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2007හි විධිවිධාන යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවනු ලබන නිලධරයන්ට එම චක්‍රලේඛය යටතේ අදාළ වන දීමනාව ගණනය කිරීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන IIහි සඳහන් වැටුපේ සහ ගැලපීමේ දීමනාවේ අර්ධය යොදා ගත යුතුය.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව මත නිකුත් කරන ලදී.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය